මගේ අංකය: SEC/2015/02 2015.03.25

බැංකු/ මුල්‍යායතන වෙත නිකුත් කෙරෙන චක්‍රලේඛය

# බැංකු හෝ අනෙකුත් මුල්‍යායතන මගින් ගෙවනු ලබන පොළිය මත රඳවුම් බද්ද

(සංශෝධනය කෙරෙමින් පවත්නා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 133 වන වගන්තිය)

යම් පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් යම් බැංකුවක හෝ මුල්‍යායතනයක තැන්පත් කරනු ලබන හෝ ගෙවනු ලබන යම් මුදලක් මත ගෙවිය යුතු පොළියෙන් ආදායම් බදු අඩුකිරීම සඳහා (2015 අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි 2015 අයවැය මගින් යෝජිත) සංශෝධන කෙරෙමින් පවත්නා ඉහත සඳහන් පනතේ 133 වන වගන්තියේ විධිවිධානයන් අදාළ කරගැනීමේ දී පහසුකම් සැලසීම පිණිස සෑම බැංකුවකට ම සහ අනෙකුත් මුල්‍යායතනයකට ම අවශ්‍ය සවිස්තර සටහන් සහ උපදෙස් මෙම චක්‍රලේඛයෙන් ලබාදෙයි.

1. **අඩුකිරීමේ කාලය**

පොළිය ගෙවනු ලබන අවස්ථාවේ දී හෝ තැන්පත්කරු සඳහා හෝ ඔහු වෙනුවෙන් බැංකුවක හෝ මුල්‍යායතනයක පවත්වාගෙන යනු ලබන යම් ගිණුමකට බැර කරන අවස්ථාවේ දි බදු අඩුකිරීම කළ යුතුය. කෙසේ වෙතත් වැඩි මුදල් ප්‍රමාණයක්, දරන්නා (නමින් හඳුනා නොගන්නා ලද) වෙත ගෙවනු ලබන බවට පොරොන්දු වෙමින් තැන්පත් සහතිකයක් නිකුත් කෙරෙන අවස්ථාවක දී, එම තැන්පතුව කරනු ලබන අවස්ථාවේ දී (එනම්, කලින් අඩු කිරීම) තැන්පත්කරු විසින් බැංකුවට හෝ මුල්‍යායතනයට ගෙවනු ලබන මුදලට වැඩි අතිරික්තයෙන් බදු අඩුකිරීම කළ යුතුය.

2. **නිදහස් කිරීම් (බදු අඩුකිරීමෙන්)**

ඉහත සඳහන් කරන ලද විධිවිධාන යටතේ බදු අඩුකිරීමේ අවශ්‍යතාව පහත සඳහන් පොළීවලට අදාළ නොවේ.

(I) දේශීය ආදායම් පනත යටතේ යම් විධිවිධානයක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන යම් පොළියක්.
<u>එම නිදහස් කිරීමවලට පහත සඳහන් නිදහස් කිරීම් විශේෂයෙන්ම ඇතුළත් වේ ;</u>

(අ) 2015 ජනවාරි 01 වන දිනෙන් ආරම්භ වන සහ 2015 මාර්තු 31 වන දිනෙන් අවසන් වන කාලසීමාවක් සඳහා හෝ 2015 අප්‍රේල් 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සහ ශ්‍රී ලංකාවේ වාසික සහ 2015 ජනවාරි 1 වන දිනෙන් ආරම්භ වන සහ 2015 මාර්තු 31 වන දිනෙන් අවසන්වන කාලය තුළ වයස අවුරුදු හැටට (60) හෝ එයට වැඩි වයසට එළඹෙන හෝ 2015 අප්‍රේල් 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන තක්සේරු වර්ෂයේ පළමුවන දින වයස අවුරුදු 59 ට වඩා වැඩි යම් පුද්ගලයෙකුට, සාමාන්‍ය ජනතාවගෙන් තැන්පතු භාරගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසරය ලබා දී ඇති යම් බැංකුවක් හෝ මුල්‍යායතනයක් පවත්වාගෙන යනු ලබන, යම් තැන්පතුවකින් උපචිතවන හෝ උද්ගතවන පොළිය;

(ආ) 2015 අප්‍රේල් 1 දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා එක් ඉතුරුම් ගිණුමක් හෝ එකකට වැඩි ඉතුරුම් ගිණුම් පවත්වාගෙන යනු ලබන යම් පුද්ගලයකුට හෝ පුණ්‍යායතනයකට, මාසයක් සඳහා ගෙවනු ලබන පොළිය රු.5000/- කට වඩා අඩුවන අවස්ථාවක දී උපචිතවන හෝ උද්ගතවන පොළිය;

මෙම ඡේදයේ කාර්යය සඳහා "ඉතුරුම් ගිණුම" යන්නෙන් එම ගිණුමෙන් මුදල් ආපසු ලබාගැනීම සඳහා හිමිකමකට බලපාන යම් කොන්දේසියකට යටත් වුවද, නොවුවද සහ තැන්පතුව පවත්වාගෙන යනු ලබන කාලසීමාව මත රඳා නොපවතින අනුප්‍රමාණයක් යටතේ පොළිය දරන ගිණුමක් අදහස් වේ.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව යම් වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක (යම් තැනැත්තකු) ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් විවෘත කරන ලද යම් ගිණුමක විදේශ ව්‍යවහාර මුදලකින් ඔහුට බැර කරනු ලබන මුදල් මත යම් තැනැත්තෙකුට උපචිතවන පොළිය;
(NRFC හෝ RFC ගිණුම්)

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත තිබූ විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු තැන්පත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව වාණිජ බැංකුවක විවෘත කර ඇති විශේෂ ගිණුමක තැන්පත් මත උපචිත වන පොළිය;
(විශේෂිත ගිණුම්)

(ඉ) යම් පුණ්‍යායතනයක් විසින් පවත්වාගෙන යනු ලබන ළමා නිවාසයකට, වැඩිහිටි හෝ ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණය සැලසීමේ කාර්යයන් සඳහාම පමණක් එම පොළිය අදාළ කරගනු ලබන බවට එම තක්සේරු වර්ෂයට අදාළව කොමසාරිස් ජනරාල් සෑහීමකට පත්වන බවට සනාථ වන්නා වූ යම් පුණ්‍යායතනයකට යම් තක්සේරු වර්ෂයක දී උපචිතවන පොළිය; **(මෙම නිදහස් කිරීම සඳහා එම ආයතනය සුදුසුකම් ලබා ඇති බවට බැංකුව හෝ මූල්‍යායතනය විසින් දෙපාර්තමේන්තුවෙන් තහවුරු කරගැනීමක් ලබාගත යුතුය.)**

(ඊ) යම් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක (FCBU) විදේශ ව්‍යවහාර මුදලින් ඔහුට බැරකරන මුදලින් යම් තැනැත්තකුට උපචිතවන පොළිය;

(උ) යම් සුරැකුම්පත් ආයෝජන ගිණුමක තැන්පත් කරනු ලබන යම් මුදලකින් යම් තැනැත්තෙකුට උපචිතවන පොළිය;

(II) (අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ ඒකාබද්ධ අරමුදලට හෝ පළාත් සභාවක යම් පළාත් අරමුදලකට; හෝ

(ආ) දේශීය ආදායම් පනතේ 7 වන වගන්තියේ **(අ), (ඇ), (ඈ), (උ), (ඌ) සහ (එ)** යන ඡේදයන්හි සඳහන් යම් ආයතනයකට.

ගෙවිය යුතු යම් පොළියක්:

(III) දේශීය ආදායම් පනතේ 37 වන වගන්තිය (විශේෂිත දිගුකාලීන ගිණුම්) හෝ 95 වන වගන්තිය යටතේ (ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තන්ට ගෙවනු ලබන පොළිය යම් පුද්ගලයෙකුට කරනු ලබන පොළී ගෙවීමක් හැර) අඩු කරනු ලැබිය යුතු බද්දෙන් යම් පොළියක්;

## 3. බදු අඩුකිරීමේ අනුප්‍රමාණයන්

පොළී ගෙවන හෝ මුල් ගෙවීමට වැඩි අතිරික්තයක් ලෙස සඳහන් (යම් තැන්පතු සහතිකයක් සම්බන්ධයෙන් වන විට) යම් මුදලක් සඳහා ඉඩ ලබාදෙන සෑම බැංකුවක්ම හෝ මූල්‍යායතනයක්ම පහත සඳහන් පරිදි (නිදහස් කර නොමැත්තේ නම්) එම පොළියෙන් හෝ අතිරික්තයෙන් ආදායම් බදු අඩුකළ යුතුය.

(i) කිසියම් සමාගමකට [පුණ්‍යායතනයක් හැර] යම් පොළියක් ගෙවනු ලබන්නේ නම් හෝ බැර කරනු ලබන්නේ නම්, එම පොළිය මත බදු අඩු කිරීමට අදාළ අනුප්‍රමාණය 10% කි.

(ii) යම් තැන්පතු සහතිකයක වටිනාකම මත ඉඩ ලබාදෙනු ලබන යම් අතිරික්තයක් සඳහා (1 වන ඡේදයේ සඳහන් පරිදි) එම අතිරික්තය මත අදාළ බදු අඩුකිරීමේ අනුප්‍රමාණය 10%කි.

(iii) යම් පොළියක්, පුද්ගල මණ්ඩලයකට ගෙවනු ලබන්නේ නම් හෝ බැර කරනු ලබන්නේ නම් (යම් පුණ්‍යායතනයක් හැර) අදාළ බදු අඩුකිරීමේ අනුප්‍රමාණය 8% කි.

(iv) මෙම උපදෙස් මාලාවේ 2 වන ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන් හි සඳහන් පුද්ගලයකුට (95 වන වගන්තිය යටතේ විධිවිධාන අදාළවන ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයින් ද ඇතුලුව) පුණ්‍යායතනයකට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවනු ලැබ හෝ බැර කරනු ලැබ ඇත්නම්, සියයට 2.5 කින් රඳවුම් බදු අනුප්‍රමාණය ගෙවන ලද හෝ බැර කරන ලද පොළී මුදල නොසලකා අදාළ කර ගත යුතුය.

**සටහන:**

(අ) ඉහත සඳහන් කරන ලද පරිදි සියයට 2.5 තනි රඳවුම් බදු අනුප්‍රමාණයක් පුද්ගලයින්ට හෝ **පුණ්‍යායතනවලට ගෙවනු ලැබ හෝ බැර කරනු ලැබ ඇති පොළිය** මත හඳුන්වා දී ඇති බැවින්, **පොළිය ගෙවනු ලබන හෝ බැර කරනු ලබන බැංකු හෝ මූල්‍යායතනවලට** එම පුද්ගලයන් **හෝ ආයතනයන් විසින් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පැන නොනගී.**

(ආ) දේශීය ආදායම් කොමසාරිස් හෝ එම දේශීය ආදායම් කොමසාරිස් විසින් බලය පවරන ලද යම් නිලධාරියෙකු විසින් නියෝගයක් නිකුත් කර ඇත්නම් (6 වන ඡේදයේ සඳහන් පරිදි) අඩුකිරීම, එම නියෝගයට අනුකූලව සිදු කළ යුතු අතර කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද එම නියෝගය සුරක්ෂිතව තබාගත යුතු අතර, පරීක්ෂා කර බැලීම (අවශ්‍ය නම්) සඳහා කොමසාරිස් ජනරාල් විසින් බලය පවරන ලද යම් නිලධාරියකුට ප්‍රයෝජන ගැනීමට ඉඩ සැලසිය යුතුය.

## 4. බද්ධ ගිණුම

බැංකුවට හෝ මූල්‍යායතනයට ලබාදෙන ලද විධානයට අනුව පුද්ගලයින්ගේ බද්ධ ගිණුමේ පොළිය එම පුද්ගලයින් අතර විභජනය කරනු ලැබිය හැකි අතර, එලෙස එක් එක් පුද්ගලයා වෙත විභජනය කරන ලද එම පොළී කොටස එම තැනැත්තාට ගෙවිය යුතු පොළිය ලෙස සලකනු ලැබිය හැකිය.

## 5. බදු අඩුකිරීමේ සහතිකය

ඉහත 3 වන ඡේදයට අනුකූලව ආදායම් බදු අඩුකරන සෑම බැංකුවක්ම හෝ මූල්‍යායතනයක්ම පහත සඳහන් ආකෘති පත්‍රයට අනුව සෑම තැන්පත්කරුවෙකුට ම, (පුද්ගලයින්, හවුල් ව්‍යාපාර, සමාගම් හෝ පුද්ගල මණ්ඩල) බදු අඩුකිරීමේ සහතිකයක්, එක් එක් අඩුකිරීමට අදාළව නිකුත් කළ යුතුය.

**බදු අඩුකිරීමේ සහතිකය**

බැංකුවේ /මූල්‍යායතනයේ නම සහ ලිපිනය ..........................................................................
..........................................................................

තැන්පත්කරුගේ නම සහ ලිපිනය ..........................................................................
..........................................................................

තක්සේරු වර්ෂය ..........................................................

(අ) දළ පොළී මුදල ..........................................................

(ආ) i. බදු අනුප්‍රමාණය ..........................................................

ii. අඩුකරන ලද බදු මුදල ..........................................................

............................................ ........................................
බලයලත් නිලධරයාගේ නම බලයලත් නිලධරයාගේ අත්සන

දිනය ...................................

සටහන: සමාගමක් හැර යම් තැනැත්තෙකුගේ යම් තැන්පතුවක් මත පොලියෙන් බද්දක් අඩුකිරීම නිසි පරිදි කරනු ලබන්නේ නම්, එම පොලියෙන් බදු අඩුකිරීම අවසානාත්මක වේ.

## 6. විධානය

ආදායම් බදු අඩුකරන ලද පොළිය, පොළී ලාභියාගේ තක්සේරු කළ හැකි ආදායමේ කොටසක් වන අවස්ථාවක දී, එම තැනැත්තා එකී තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද, බැංකුව/මූල්‍යායතනය විසින් අඩු කළ හැකි බද්දට වඩා අඩු බව හැඟී යන්නේ නම්, ආදායම් බදු අඩු කිරීමේ දී අදාළ වෙනස්කම් කිරීමට බැංකුව/මූල්‍යායතනය වෙත නියෝගයක් නිකුත් කිරීමට කොමසාරිස් ජනරාල් මගින් (නියෝග අයදුම්පතක් මගින්) ඉල්ලීමක් කළ හැක. එවැනි අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්ගේ අධිකාරිත්වය මත නිකුත් කරන ලද නියෝගයට බැංකුව/මූල්‍යායතනය ගරු කළ යුතුය.

## 7. බැංකුවක් සහ අනෙකුත් මූල්‍යායතනයක් මගින් පවත්වාගෙන යා යුතු වාර්තා සහ ඒවායේ අනෙකුත් බැඳීම්

සෑම බැංකුවක් සහ මූල්‍යායතනයක් විසින්,

යම් තැනැත්තෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට යම් තක්සේරු වර්ෂයක දී අවස්ථාවෝචිත පරිදි කරන ලද අතිරේක පොළිය සහ පොළිය හෝ අතිරේකය ගෙවනු ලබන දිනය හෝ දින පිළිබඳ නියමිත වාර්තාවක් පහත සඳහන් පරිදි තබාගත යුතුය.

තක්සේරු වර්ෂය ...........................

(අ)

| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) |
|---|---|---|---|---|---|---|---|
| අනුක්‍රමික අංකය | නම සහ ලිපිනය | ගිණුම් අංකය | තැන්පත් මුදල | තැන්පතු වර්ගය | පොළිය/ අතිරේකය | බදු අනුප්‍රමාණය | අඩුකරන ලද බදු |
| | | | | | | | |

(ආ) මෙම උපදෙස් මාලාවේ 2 වන ඡේදයේ සඳහන් පරිදි අඩුකිරීම්වලින් නිදහස් කිරීම් හේතුකොටගෙන රඳවුම් බදු අඩු නොකරන ලද පොළිය පිළිබඳ වාර්තාවක් පහත සඳහන් ආකාරයෙන් තබාගැනීම.

තක්සේරු වර්ෂය ..............................

| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) |
|---|---|---|---|---|---|---|
| අනුක්‍රමික අංකය | තැන්පතු වර්ගය | අංශයේ සංකේතය | පොළී ආදායම් ලැබූ තැනැත්තන්ගේ නම් | හැඳින්වීමේ අංකය | ගෙවිය යුතු පොළිය | නිදහස් කිරීමට හේතු |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

- ඉහත සඳහන් වාර්තා පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල් විසින් ලිඛිතව බලය පවරනු ලබන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අවසර ලබා දෙන්න.

## 8. වාර්තා සහ උපලේඛන ඉදිරිපත් කිරීම

**වාර්තාව**

ඉහත අංශය මගින් නිකුත් කරනු ලබන ගෙවීම් පත්‍රිකාවක් මගින් මහජන බැංකුවේ ගිණුම් අංක 204-1-001-8-0085128 වෙත අදාළ බදු මාසිකව ගෙවීමෙන් පසුව රඳවුම් බදු අංශය මගින් නිකුත් කරනු ලබන නිසි පරිදි පිළියෙල කරන ලද කාර්තුමය වාර්තා 2015 අප්‍රේල් 01 වන දින හෝ එදිනට පසුව ආරම්භවන තක්සේරු වර්ෂයට අදාළ ගෙවීම් පත්‍රිකාවේ තුන්වන පිටපත සමග අදාළ කාර්තුව අවසානයේ පූර්ව ආසන්නතම මාසයේ ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර රඳවුම් බදු අංශය (පොළිය මත) වෙත ඉදිරිපත් කළ යුතුය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රඳවුම් බදු අංශය (WHT) (පොළිය මත) –විසින් නිකුත් කරනු ලබන වාර්තාවේ ඡායාස්ථ පිටපත් භාරගනු නොලබන බව කාරුණිකව සලකන්න. එසේම, කිසිදු බද්දක් ගෙවීමට නොමැති අවස්ථාවන්හි දී ද වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

**උපලේඛන:**

2015.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි, දේශීය ආදායම් පනතේ 133,134, හෝ 135 වගන්තිය යටතේ ගෙවන ලද හෝ බැර කරන ලද පොලිය හෝ අවසර දෙන ලද වට්ටම මත හෝ 160 වන වගන්තියේ සඳහන් යම් වාර්ෂිකයක් , රාජ්‍ය භාගයක්, කළමණාකරණ ගාස්තුවක් මත අඩු කරන ලද රඳවුම් බදු මත හෝ 157 වන වගන්තියේ සඳහන් යම් ත්‍යාගයක්, දඩ මුදල් කොටසක් , ලොතරැයි දිනුම්, ඔට්ටු හා සූදු ඇල්ලීම් හෝ 36,37,38, 39,95 සහ 161(අ) යන වගන්ති යටතේ අඩු කරන ලද රඳවුම් බදු මත පහත සඳහන් උපලේඛන ඉදිරිපත් කළ යුතු බව කාරුණිකව සලකන්න.

**<u>උපලේඛනය - 1</u>**

**රජයේ සුරැකුම්පත් මත රඳවුම් බදු**

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| අනුක්‍රමික අංකය | රජයේ සුරැකුම්පත් වර්ගය | මූල්‍යායතනයේ නම | රඳවුම් බදු වටිනාකම රු. | අඩු කරන ලද දිනය |
| | | | | |
| | | | | |
| එකතුව | | | | |

- මෙම උපලේඛනය අදාළ වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුවට පමණි.

## <u>උපලේඛනය - 2</u>

**<u>තැන්පතු සහ සංස්ථාපිත ණය සුරැකුම්පත්වලින් රඳවුම් බදු</u>**

| |
|---|
| පුද්ගලයින්ගෙන්, හවුල් ව්‍යාපාර සහ පුණ්‍යායතනවලින් රඳවුම් බදු.<br>සමාගම් සහ ආයතනවලින් (සමාගම් නොවන) රඳවුම් බදු.<br>සංස්ථාපිත ණය සුරැකුම්පත් මත රඳවුම් බදු. |

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | තැන්පතු/ සුරැකුම් වර්ගය | නම | ලිපිනය | TIN | ගිණුම් අංකය/ ණය සුරැකුම් අංකය | අංශ කේතය | තැන්පතු/ ණය සුරැකුම් ආරම්භ කළ දිනය (දි.මා.ව.) | පරිගණක ගත වීමේ දිනය (දි.මා.ව.) | තැන්පතු වටිනාකමේ අගය (රු.) | පොළී අනුපාතය (%) | ගෙවන ලද / යුතු පොළිය (රු.) | ර.බ. අනුප්‍රමාණය (%) | ර.බ. (රු.) |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |

- පුද්ගලයින්ගෙන් ,හවුල් ව්‍යාපාර, පුණ්‍යායතන, සමාගම් සහ වෙනත් සියලු ආයතනවලින් කෙරෙන තැන්පතු සහ සංස්ථාපිත ණය සුරැකුම් මත රඳවුම් බදු මෙම උපලේඛණය මගින් ප්‍රකාශ කළ යුතුය.

## <u>උපලේඛනය - 3</u>

**විශේෂ විධිවිධාන යටතේ රඳවුම් බදු**

| ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තන්ගෙන් රඳවුම් බදු (95 වන වගන්තිය)<br>වාර්ෂික/ රාජ්‍යභාග/ කළමනාකරණ ගාස්තු මත රඳවුම් බදු (160 වන වගන්තිය)<br>විශේෂ විධිවිධාන (36, 37, 38, 39, 161 A වගන්ති) සහ වෙනත් විධිවිධාන යටතේ රඳවුම් බදු අඩුකිරීම<br>තිළිණ/ දඩ කොටස්/ ලොතරැයි/ ත්‍යාග ඔට්ටු සහ සූදු මත රඳවුම් බදු (157 වන වගන්තිය) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| අනු අංකය | වර්ගය/විස්තරය/ වගන්තිය | නම | ලිපිනය | ජා.හැ./TIN/ ගමන් බලපත් අංකය | ගෙවූ දිනය/සිද්ධි(event)/ වෙන්දේසි (දි.මා.ව.) | අගය (රු.) | ර.බ අනුප්‍රමාණය (රු.) | ර.බ (රු.) |
| | | | | | | | | |
| උප එකතුව | | | | | | E1= | | E2= |

- දේශීය ආදායම් පනතේ 36, 37, 38, 39, 95, 157, 160 සහ 161 (අ) වගන්ති යටතේ අඩු කරන ලද රඳවුම් බදු.

උපලේඛනය - 4

**රඳවුම් බදු නිදහස් කිරීම පිළිබඳ විස්තර**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | තැන්පතු වර්ගය | අංශ කේතය | පොළී ලාභියාගේ නම | ජා.හැ./TIN/ | ගෙවන ලද පොළී මුදල | නිදහස් කිරීම සඳහා හේතුව |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

පොළී ගෙවීම් සහ බදු අඩුකිරීම්වලට අදාළව කොමසාරිස් ජනරාල් විසින් නියම කර ඇති විස්තර ඇතුළත්ව කාර්තුමය පදනමක් මත කොමසාරිස් ජනරාල් වෙත උපලේඛන ඇතුලු වාර්තාවක් සෑම බැංකුවක්ම හෝ මුල්‍යායතනයක් ම විසින් ඉදිරිපත් කළ යුතු අතර, ඒවා මීළඟ නියමිත දිනයන්හි දී හෝ එම දිනවලට පෙර ඉදිරිපත් කළ යුතුය.

- පළමු කාර්තුව (අප්‍රේල්, මැයි, ජූනි) ජූලි 15 දින හෝ එදිනට පෙර
- දෙවන කාර්තුව (ජූලි, අගෝස්තු, සැප්තැම්බර්) ඔක්තෝබර් 15 දින හෝ එදිනට පෙර
- තුන්වන කාර්තුව (ඔක්., නොවැ., දෙසැ.) ජනවාරි 15 දින හෝ එදිනට පෙර
- හතරවන කාර්තුව (ජනවාරි, පෙබ., මාර්තු) අප්‍රේල් 15 දින හෝ එදිනට පෙර

**සටහන: උපලේඛන විද්‍යුත් මාධ්‍යයෙන් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් බදු ගෙවන්නන් සංඛ්‍යාව 10 ට වඩා අඩු නම්, දෘඪ පිටපත් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.**

එසේම,

- රඳවුම් බදු අඩුකරනු ලබන පුද්ගලයින්ගේ තැන්පතු; සහ
- රඳවුම් බදු අඩු නොකරන ලද ඉතුරුම් ගිණුම් සම්බන්ධයෙන්,

විශේෂ කාර්යයක් සඳහා ඉල්ලුමකර නොමැත්තේ නම්, උපලේඛන එවීමේ අවශ්‍යතාවයක් නොමැත.

9. **ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය**

දේශීය ආදායම් පනතේ 150 වන වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි, බැංකුව හෝ මුල්‍යායතනය විසින් බදු අඩුකිරීම ආරම්භ කිරීමට දින 30 කට පෙර කොමසාරිස්, (රඳවුම් බදු) කොමසාරිස් ජනරාල් බලය පවරනු ලබන නිලධරයා වෙතින් ලියාපදිංචි අංකයක් ලබාගෙන වාර්තා ඉදිරිපත් කළ යුතුය.

**කල්‍යාණි දහනායක**
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්